සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2021 ජනවාරි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2021-03-20
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## <u>A කොටස</u>

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

කෝවිඩ්-19 (COVID-19) වසංගතය හේතුවෙන් විවිධ වූ කර්මාන්ත තුළ ඇති අස්තිත්වයන්ට සැළකිය යුතු අභියෝගයන්ට මුහුණදීමට සිදුව තිබේ. කෝවිඩ්-19 හේතුවෙන් බාහිර පරිසරයේ ඇතිවූ වෙනස්වීම්වලට උදාහරණ පහත පරිදි වේ:

- ණය සේවා මත "තාවකාලිකව අත්හිටුවීමේ" (moratorium) රජයේ ප්‍රතිපත්තිය.
- සරල බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ රජයේ ප්‍රතිපත්තිය.
- පොලී අනුපාත අඩු කිරීම.
- භෞතික රැස්වීම් වෙනුවට අන්තර්ජාලය හරහා රැස්වීම් පැවැත්වීම (උදාහරණ: Skype, Zoom, Teams, යනාදිය හරහා).
- සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීම සම්බන්ධයෙන් නීති හා විධිවිධාන හඳුන්වා දීම.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් උදාහරණය බාහිර පාරිසරික සාධක / PESTEL බලවේගයන් සමඟ **සම්බන්ධ කරන්න**.

(ලකුණු 05)

## **02** වන ප්‍රශ්නය

අවදානම් (risk) අවම කිරීමේ ක්‍රමවේදයන් මගින් ව්‍යාපාරික අවදානම සම්පූර්ණයෙන්ම වළක්වා ගත හැකිද යන්න පිළිබඳව ඔබේ මිතුරෙකු වන **රාජ්** හට දැනගැනීමට අවශ්‍යව ඇත.

අවදානම් අවම කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කළත් ව්‍යාපාරික අවදානම සම්පූර්ණයෙන්ම වළක්වා ගත නොහැකි බව ඔබ විසින් ඔහුට පැහැදිලි කර දී තිබේ. අවදානම් වැළැක්වීම (risk avoidance) සහ අවදානම් අඩු කිරීම (risk reductions) අවදානම් අවම කිරීම (risk mitigating) සඳහා භාවිත කරන ක්‍රම දෙකකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අවදානම් වැළැක්වීම (risk avoidance) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි උදාහරණයන් සහිතව **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) අවදානම් අඩු කිරීම (risk reduction) සඳහා භාවිත කරන උපක්‍රම දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත S&S ලංකා (පෞද්ගලික) සමාගමට** එහි විගණකයින් වෙනස් කිරීමේ ප්‍රතිපත්තිය අනුව සෑම වර්ෂ 5 ක කාලපරිච්ඡේදයකට වරක් සමාගමේ බාහිර විගණකවරුන් වෙනස් කිරීමට අවශ්‍යව ඇත. **සීමාසහිත S&S ලංකා (පෞද්ගලික) සමාගමේ** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික විගණනය සිදුකිරීම සම්බන්ධයෙන් විගණන කාර්යභාරය බාරදීම සම්බන්ධව සාකච්ඡා කිරීමට එම **සමාගමේ** අධ්‍යක්ෂ මණ්ඩලය ඔබේ විගණන ආයතනය වෙත පැමිණ ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත S&S ලංකා (පෞද්ගලික) සමාගමේ** සහතිකවීමේ කාර්යභාරයක් බාර ගැනීමේදී සහ කළමනාකරණය කිරීමේදී සළකා බැලිය යුතු ප්‍රධාන පැතිකඩ සහ අවශ්‍යතාවයන් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග (elements) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

විගණන ආයතනය සහ එහි සේවකයන් වෘත්තිය ප්‍රමිතීන්ට සහ අදාල නෛතික සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බව සහ විගණන ආයතනය හෝ විගණනය බාරගත් හවුල්කරුවන් විසින් නිකුත් කරන ලද වාර්තා අදාල අවස්ථාවන්ට යෝග්‍ය වන බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා තත්ත්වපාලන පද්ධතියක් ස්ථාපිත කර, පවත්වාගෙන යාම විගණන ආයතනයක අරමුණ වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තනි කාර්යභාරයක (individual engagement) තත්ත්ව පාලනයේදී සළකා බැලිය යුතු ප්‍රතිපත්ති දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(b) සේවාදායකයාගේ අවංකභාවය (integrity) සම්බන්ධයෙන් තත්ත්වපාලන පද්ධතියක ඇතුළත් කළ යුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත කොලෝනියල් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගමේ** ("සමාගම"), 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල විගණනය සිදුකරනු ලබන **ගමගේ ඇසෝසියේට්ස්** විගණන ආයතනයේ විගණන ජ්‍යේෂ්ඨයා ඔබ වේ. විගණනය බාර හවුල්කරු විසින් අදාල සමාගමේ විගණන ලිපිගොනුව සමාලෝචනය (reviewed) කර ඇති අතර, විගණනය නිමකිරීමේ ලියවිල්ලෙන් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

- බදු පෙර ලාභය මත පදනම්ව විගණනය සඳහා නිගමනය කරන ලද ප්‍රමාණාත්මකභාවය (materiality) රු.500,000/- කි.
- සමාගම විසින් නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකර තිබේ. 2020 පෙබරවාරි 26 දින එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර, 2020 මාර්තු 01 දින සිට මෙම ගොඩනැගිල්ල භාවිතයට ගෙන ඇත. මෙම ගොඩනැගිල්ල සඳහා පිරිවැය ලෙස රු. මිලියන 15 ක්, 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන නොනිමි වැඩ යටතේ පෙන්වා ඇත. සමාගම, ගොඩනැගිලි වර්ෂ 10 ක ඵලදායී ජීවකාලයක් තුළ ක්ෂය කරනු ලැබේ.
- 2020 මාර්තු 31 දිනට රු. මිලියන 8 ක පිරිවැයකට අගය කරන ලද තොගයක් 2020 අප්‍රේල් මාසය තුළ රු. මිලියන 3 කට සමාගම විසින් විකුණන ලදි. මෙම ගනුදෙනුව හේතුවෙන් දැරූ රු.5,000,000/- ක අලාභය, 2020 අප්‍රේල් මාසය තුළදී සමාගම විසින් ගිණුම්ගතකොට ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ විගණන මතය කෙරෙහි ඉහත දැක්වූ කරුණුවල බලපෑම **තක්සේරු කරන්න.** (ලකුණු 07)

(b) විගණන මතය හැරුණු විට විගණකගේ වාර්තාවේ ඇතුළත් මූලිකාංග තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 06 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත YP (පෞද්ගලික) සමාගම** ("සමාගම"), හෝටල් සඳහා පලතුරු සහ එළවළු සැපයීමේ නිරත සමාගමකි. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ව්‍යවස්ථාපිත විගණනය සිදුකරන ලෙස සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔබගේ ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත. සමාගමේ පෙර විගණන ආයතනය මෙරට ප්‍රමුඛ විගණන ආයතනයක් වන අතර, එම ආයතනය විසින් සමාගමේ විගණනය සිදුකිරීම ප්‍රතික්ෂේප කොට ඒ බව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලිඛිතව දැනුම් දී තිබේ.

සමාගමේ කළමණාකාරිත්වය සමඟ කළ මූලික සාකච්ඡාවේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සමාගමේ වාර්ෂික පිරිවැටුම රු. මිලියන 800 ක් බවත් බැංකුවේ ඇති මුදල් ශේෂය රු. බිලියන 1.5 ක් බවත් ඔබ විසින් සටහන් කරගන්නා ලදි. සමාගමට විරුද්ධව අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බව ඔබගේ අවධානයට ලක්වූ නමුත් මෙය මූලික සාකච්ඡාවේ න්‍යාය පත්‍රයේ අයිතමයක් ලෙස ඇතුළත් නොවීය.

තවද, 2021 අප්‍රේල් 20 දින වන විට විගණනය අවසන් කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා කරන අතර, එම කාල පරිච්ඡේදය තුළදී ආයතනයේ හවුල්කරුවන් තිදෙනාම ඉතා හදිසි නියමිත දිනට අවසන් කළ යුතු වෙනත් විගණන (deadline audits) සේවාදායකයන්ගේ විගණන කටයුතුවල නිරත වන අතර, ජ්‍යෙෂ්ඨ විගණන සාමාජිකයන් දෙදෙනෙකු ආයතනයේ විදේශීය ශාඛාවට අනුයුක්ත වනු ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඔබගේ විගණන සේවාදායකයෙකු ලෙස **සීමාසහිත YP (පෞද්ගලික) සමාගමේ** විගණනය බාර ගැනීම පිළිබඳ තීරණයක් ගැනීමට පෙර ඔබ විසින් සළකා බැලීමට අවශ්‍ය කරුණු තුනක්(03) **තක්සේරු කරන්න.** (ලකුණු 06)

(B) විගණන කාර්යභාරයක් සම්බන්ධයෙන් එය පොදු යහපත සඳහා වන අතර, එම නිසා වෘත්තීය ආචාරධර්ම සංග්‍රහයට අනුව විගණන කණ්ඩායම්වල සහ විගණන ආයතනවල සාමාජිකයන්, විගණන සේවා දායකයන්ගෙන් ස්වාධීන විය යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ස්වාධීනත්වයට තර්ජනයන් විය හැකි තත්ත්වයන් (circumstances) / සම්බන්ධතාවයන් (relationships) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(A) **රංග, YTR ඇසෝසියේට්ස්** විගණන ආයතනයේ, විගණන ජ්‍යෙෂ්ඨයෙකු වන අතර, ඔහු **සීමාසහිත බෙත් (පෞද්ගලික) සමාගමේ** 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ව්‍යවස්ථාපිත විගණනය සැලසුම් කරමින් සිටී. වෙළෙඳ ලැබිය යුතු මුදල්වලට අදාල විගණන සැලසුමෙන් සහ විගණන වැඩ පත්‍රිකාවලින් උපුටා ගන්නා ලද සංක්ෂිප්තයන් පහත සඳහන් පරිදි වේ:

- විශාල ශේෂයන් ඇති ගනුදෙනුකරුවන් සිටිනුයේ 5 දෙනෙකු පමණි.
- වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයේ පැවැත්ම (existence) මත ප්‍රමාණාත්මක අවප්‍රකාශන ඇතිවීමේ අවධානම වැඩි බව විගණක විසින් තක්සේරු කර ඇත.
- ශේෂය තහවුරු කිරීමේ ඉල්ලීමෙහි දක්වා ඇති තොරතුරු සමග තහවුරු කරන පාර්ශවය එකඟ නොවන්නේ නම් පමණක් විගණක විසින් ප්‍රතිචාර අපේක්ෂා කරයි. ඒ හැරුණු විට වෙළෙඳ ලැබිය යුතු මුදල්හි පැවැත්ම තහවුරු කිරීම සඳහා වෙනත් තහවුරු කිරීමේ විගණන ක්‍රියා පටිපාටි ඉටුකර නොතිබුණි.
- ප්‍රධාන විධායක නිලධාරි විසින් නම් කරන ලද ගනුදෙනුකරුවෙකුගේ ශේෂය තහවුරු කිරීමට ලිපියක් නොයවන ලෙස විගණකගෙන් ඉල්ලීමක් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණක විසින් අනුගමනය කරන ලද බාහිර තහවුරු කිරීමේ (external confirmation) ක්‍රියාවලියේ දුර්වලතා දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ප්‍රධාන විධායක නිලධාරියා විසින් සිදුකර ඇති ඉල්ලීම මත **රංග** ට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(B) මූල්‍ය ප්‍රකාශන විගණනයකදී විගණක විසින් පසුව ඇතිවන සිදුවීම් (subsequent events) මත විගණන ක්‍රියා පටිපාටි ඉටුකරනු ලබයි. විගණන ක්‍රියාපටිපාටිවල කොටසක් ලෙස, කළමනාකාරීත්වය සහ පාලනය පිළිබඳ වගකිවයුතු පුද්ගලයන්ගෙන් විමසීම් සිදුකරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

කළමනාකාරීත්වයෙන් සහ පාලනය පිළිබඳ වගකිවයුතු පුද්ගලයන්ගෙන් විගණක විසින් සිදුකළ හැකි එවැනි විමසීම් හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

(A) **සීමාසහිත Bio In One (පෞද්ගලික) සමාගම ("BIO")** දේශීය වෙළෙඳපොළ සඳහා පිටිකළ පොල් කිරි නිෂ්පාදනයේ යෙදී සිටී. සමාගම වසර හයකට (06) පෙර ස්ථාපිත කරන ලද අතර, ආරම්භක මෙහෙයුම් සුළු පරිමාණයෙන් සිදුකරන ලදී. මේ වන විට සමාගම සුපිරි වෙළෙඳසැල්, සෘජු බෙදාහරින්නන් සහ නියෝජිතයන් ඇතුළත්ව තොග ගනුදෙනුකරුවන් 50 දෙනෙකුට වැඩි පිරිසක් දක්වා ව්‍යාප්ත කොට ඇත. සමාගමේ නිෂ්පාදන කම්හලේ සේවකයන් 120 ක් සේවයේ නියුතු වේ. කෙසේ වුවද, විධිමත්ව සකස් කරන ලද ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලීන් **BIO සමාගම** සතු නොවේ.

- ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ භාර්යාව වන **තිලානි මහත්මිය** ඉන්වොයිස් කිරීම සහ හිඟ මුදල් එකතුකිරීමේ ක්‍රියාවලියේ පසු විපරම් සිදුකිරීමේ කාර්යයේ නිරත වේ. නමුත් ඇයට ගිණුම්කරණය හෝ මූල්‍ය පිළිබඳ පසුබිමක් නොමැත.
- කළමනාකරණ අධ්‍යක්ෂ විසින් ව්‍යාපාරයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ තක්සේරුවක් සිදුකරන මෙන් ඔබගේ වෘත්තීය ගිණුම්කරණ ආයතනයට ඉල්ලීමක් කර ඇත. මෙම කාර්යය බාර ඔබ ගිණුම්කරණ ආයතනයේ හවුල්කරු විසින් පහත සඳහන් තොරතුරු සඳහන් කර තිබේ:
    - පසුගිය වසර 3 ක කාලය සඳහා සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට නොමැත.
    - ද්‍රව්‍ය මිලදී ගැනීමේ වාර්තා සහ ගෙවීම්වලට අදාළ ආධාරක ලියකියවිලි ක්‍රමානුකූලව සමාගම පවත්වාගෙන නොයයි. ව්‍යාපාරයේ ප්‍රධාන කොටස්හිමියා වන කළමනාකරණ අධ්‍යක්ෂක පෞද්ගලිකවම අමුද්‍රව්‍ය සහ වෙනත් සැපයුම් මිලදී ගැනීම සඳහා සම්බන්ධ වේ.
- සේවාදායකයා සමඟ කළ සාකච්ඡාවේදී මෙම කාර්යය බාර හවුල්කරු විසින් කළමනාකරණ අධ්‍යක්ෂකවරයාට නිසි වාර්තා තබා ගැනීමත් සමඟ සමාගම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් තිබීමේ වැදගත්කම පිළිබඳව පැහැදිලි කර දී තිබේ. කළමනාකරණ අධ්‍යක්ෂකවරයාට සමාගම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් සැකසීම සඳහා ඔබගේ ගිණුම්කරණ ආයතනයේ සහාය අවශ්‍යව ඇත. තවද, පුහුණු කාර්ය මණ්ඩලයක් සහිතව පරිගණකගත පද්ධතියක් ස්ථාපිත කිරීමට ද තීරණය කෙරිණි.
- පළමු පියවර ලෙස, **BIO සමාගම** සඳහා යෝජිත අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂකට, **තිලානි මහත්මියට** සහ තවත් කළමනාකරුවන් දෙදෙනෙකුට ඉදිරිපත් කරන මෙන් කළමනාකරණ අධ්‍යක්ෂක විසින් මෙම කාර්යය බාර හවුල්කරුගෙන් ඉල්ලීමක් කර ඇත. **BIO සමාගම** විසින් පරිගණකගත පද්ධතියක් භාවිත කිරීමට යන බැවින්, තොරතුරු තාක්ෂණයට අදාළ පොදු (general) පාලනයන් සහ යෙදුම් (application) පාලනයන් පිළිබඳ පැහැදිලි කිරීමක් ද කරන ලෙස අදාළ හවුල්කරුගෙන් ඉල්ලීමක් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **BIO සමාගමේ** අභන්තර පාලන දුර්වලතා තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) **BIO සමාගමේ** සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් සමඟ පහත පාලනයන් අදාළ වන ආකාරය, ඊට සම්බන්ධ උදාහරණයක් ද සමඟ **පැහැදිලි කරන්න**:

- මෙහෙයුම් පාලන (operational controls).
- මූල්‍ය පාලන (finance controls).
- අනුකූලතා පාලන (compliance controls). (ලකුණු 06)

(c) **BIO සමාගමට** අදාලව, ඔබ විසින් වෙන් වෙන් වශයෙන් හඳුනාගත යුතු ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලි (key business processes) හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(d) තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් (General Controls) සහ තොරතුරු තාක්ෂණ යෙදුම් පාලනයන් (Application Controls) හි අරමුණ **වෙනස්කොට දක්වන්න**. (ලකුණු 03)

(B) සමාගමකට හොඳ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතී නම්, වංචා හා වැරදි සිදුවීමේ අවදානම ඉවත්කළ හැකි බව ඔබේ මිතුරෙකු විසින් ප්‍රකාශ කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ඔබේ මිතුරාගේ ප්‍රකාශයේ වලංගුභාවය (validity) **විමසන්න.** (ලකුණු 04)

(b) අභ්‍යන්තර පාලන පද්ධතියක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(c) COSO හි සඳහන් පරිදි, අභ්‍යන්තර පාලන පද්ධතියක සංරචක (components) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

(A) පසුගිය වර්ෂ තුනේම **සීමාසහිත බෙල් (පෞද්ගලික) සමාගමේ ("බෙල්")** ව්‍යවස්ථාපිත විගණනය භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකයා ඔබ වේ. **බෙල් සමාගම** වාහන සඳහා ටයර් නිෂ්පාදනයේ යෙදී සිටින අතර, සමස්ත නිෂ්පාදිතයම යුරෝපීය වෙළෙඳපොළට අපනයනය කරනු ලබයි. විගණන කාර්යභාරය සම්බන්ධ පහත සඳහන් තොරතුරු විගණන සැලසුම් ලියවිල්ලෙන් සහ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා ඔබේ විගණන ජ්‍යෙෂ්ඨයා වන **කසුන්,** පිළියෙල කරන ලද විගණන වැඩ පත්‍රිකාවලින් උපුටා ගන්නා ලදී.

**බෙල් සමාගම** එක් පවුලකට අයත් ව්‍යාපාරයක් වන අතර, එහි වර්තමාන හිමිකාරීත්වය සහ පාලනය පහත සඳහන් පරිදි වේ:

| **නම** | **හිමිකාරීත්වය** | **සටහන්** |
|---|---|---|
| **මහේල පෙරේරා මහතා** | 60% | අධ්‍යක්ෂක |
| **අෂිනි පෙරේරා මහත්මිය** | 30% | අධ්‍යක්ෂක සහ **මහේල පෙරේරා මහතාගේ** බිරිඳ වේ. |
| **රෝස් පෙරේරා මෙනෙවිය** | 10% | අධ්‍යක්ෂක සහ **මහේල පෙරේරා මහතාගේ** සහ එම මහත්මියගේ දියණිය වේ. |

- වර්ෂය තුළදී, **බෙල් සමාගම ට** ප්‍රධාන විධායක නිලධාරියෙකු බඳවා ගන්නා ලදී.
- වර්ෂය තුළදී, **මහේල පෙරේරා මහතා** විසින් **බෙල් සමාගම** තුළ ඇති **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** 30% කොටස් අත්පත් කරගන්නා ලදී.
- රු. මිලියන 250 ක පිරිවැයක් දරා නව නිෂ්පාදන කම්හලක් ඉදිකරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන ධාරිතාව 30% කින් වැඩි වී ඇත.
- ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 (COVID-19) වසංගතයේ බලපෑම හේතුකොට ගෙන **බෙල් සමාගමේ** විකුණුම් අයභාරය පසුගිය වර්ෂයට සාපේක්ෂව 25% කින් පහළ ගොස් ඇත.

- පසුගිය කාලපරිච්ඡේදයන් තුළ අඛණ්ඩව **බෙල් සමාගම** විසින් 15% ක ලාභ ආන්තිකයක් ළඟාකරගත් අතර, එය ප්‍රවර්තන වර්ෂයේදී 10% දක්වා පහළ ගොස් ඇත.
- විකුණුම් සහ ලාභ වැනි කලින් තීරණය කරන ලද ප්‍රධාන කාර්යසාධක දර්ශක [Key Performance Indicators (KPIs)] මත පදනම්ව, ප්‍රධාන විධායක නිලධාරියාට අදාල ප්‍රසාද දීමනා තීරණය කරනු ලැබේ.
- පසුගිය වර්ෂය සඳහා යොදාගත් සේවයේ යෙදීමේ ලිපිය (letter of engagement) මෙම වර්ෂයේ විගණනය සඳහා ද යොදාගෙන ඇත.
- විකුණුම් වැඩියෙන් සටහන් කිරීම, වංචාවට ඇති අවදානමක් ලෙස සලකනු ලැබේ.
- **කසුන්** විසින් වත්කම් මත (මුළු වත්කම්වලින් 5%) පදනම්ව සමස්ත මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මකභාවය ගණනය කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **බෙල් සමාගමට** අදාලව විගණන ක්‍රියාපටිපාටි ඉටුකිරීමේදී විශේෂ අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍ර (areas) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(b) සේවයේ යෙදීමේ ලිපියේ සඳහන් නියමයන් සංශෝධනය කිරීමේදී විගණක විසින් සළකා බැලිය යුතු කොන්දේසි (conditions) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) විගණනයක් සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී විගණක විසින් වෘත්තිය විනිශ්චය භාවිත කළ යුතු ක්ෂේත්‍ර තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(d) "සැළකිය යුතු අවදානම (Significant Risk)" යන පදය **බෙල් සමාගමේ** විගණනය සම්බන්ධයෙන් **කසුන්** විසින් දැනටමත් හඳුනාගෙන ඇති උදාහරණයක් සමඟ **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(e) **බෙල් සමාගමේ** විකුණුම් විගණනය කිරීමේදී **කසුන්** විසින් ඉටුකරනු ලබන විගණන ක්‍රියා පටිපාටි (audit procedures) හතරක්(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 04)

(B) ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යටතේ, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇති බවත් එහි මෙහෙයුම් කටයුතු පෙනෙන අනාගතයක් (foreseeable future) දක්වා නොකඩවා කරගෙන යන බවටත්, උපකල්පනය කරමිනි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සැළකිය යුතු සැකයන් ඇතිවිය හැකි මූල්‍ය ඇඟවීම් (financial indicators) සඳහා උදාහරණ තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) අඛණ්ඩ පැවැත්මට බලපාන සිදුවීම් (events) හෝ කොන්දේසි (conditions) හඳුනාගත් විට, විගණක විසින් ඉටුකළ යුතු විගණන ක්‍රියා පටිපාටි (procedures) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |